

# කෑම ලෑල්ල

කතෘ- යශාලි කලාත්මා දිසානායක

# කෑම ලෑල්ල

## කතෘගේ වෙනත් කෘති

නිල් කුරුළු පවුල

ISBN-978-624-208-628-6

පාසල-මහාමායා බාලිකා විදුහල
3 වසර A

ප්‍රකාශිත දිනය 2025.02.08

# පිදුම

මහාමායා බාලිකා විදුහලේ
ගුරු මෑණියන් හට
මගේ මේ පුංචි වෑයම
උපහාරයක්ම වේවා....!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

අම්මයි මමයි එකතුවෙලා කුරුල්ලන්ට කෑම දාන ලෑල්ලක් හැදුවා. ඒත් එතන එහා ගෙදර පූසෝ දෙන්නා නිතරම ඉන්න නිසා අප්පච්චි කිව්වා කුරුල්ලන්ව අල්ලයි කියලා.






අම්මයි මමයි නුවර ගිහින් එද්දි අප්පච්චී , අයියයි අපේ ගෙදර මිදුලේ තියෙන නෙල්ලි ගහේ උඩ අත්තක ඉඳලා ගෙදර උඩ තට්ටුවෙ බැම්මෙයි අතර උණ බටයක් දාලා ඒකෙ ලීයක් හයි කරලා කුරුල්ලන්ට කෑම දාන්න 🦜🐦



අද උදේම මම නැගිටලා අම්මාගෙන්
බත් ඉල්ලන් ලෑල්ලට කෑම දැම්මට
කවුරුත් සත්තු ඇවිල්ලා නෑ......



ලේනා උදේම ඇවිත් නෙල්ලි ගහේ ඉඳන් බත් දානකන් බලන් ඉන්නවා දැක්කා . මම අම්මාගෙන් බත් ඉල්ලද්දී මෙන්න ලේනා කෑගහනවා මම ඉක්මනින්ම බත් දැම්මා . ගිරවෙකුත් ආවා බත් කන්නා දැන් ඉස්සර වගේ නෙවේ. අපේ අලුත් ලෑල්ල නිසා අපිට කෑම කන්න එන යලුවන්ව නිතර බලා ගන්නත් පුළුවන් .





ලේනා කොහොමත් එන යාලුවනේ . අද කෑදැත්තන් දෙන්නෙක් ඇවිල්ලා බත් කෑවා . හැබැයි කෑවට වඩා හොට්ටේ වද්දලා බත්ටික හලා ගත්තා . එයාලා ගියහම මම ආයෙත් බත් දැම්මා . මොකද අනිත් යාලුවෝ ආවොත් බඩගින්නෙ ඉන්න වෙන නිසා......



ලේනට නම් පොඩ්ඩක්වත් පරක්කු
වෙන්න බෑ. අද කොරිඩෝවේ
බැම්මටම ඇවිත් ගේ දිහා බලාගන
කෑගහනවා. මන් නැගිට්ට ගමන්
ඉක්මනින් ගිහින් බත් දැම්මා. ටිකකින්
කොණ්ඩ කුරුල්ලොත් ආවා.






එක දවසක හවසක පොල්කිච්චා බත් කකා ඉද්දී කොහෙන්දෝ ආපු ලස්සන පරවියෝ ජෝඩුවකුත් බත් කාලා සතුටින් වගේ ගියා...



මම ලෑල්ල අස් කරලා දාලා බත්
ගේන්න ගෙදර ඇතුලට ගියා. මෙන්න
එතකොට ලේනා කුස්සියේ ජනෙල්ලේ
ළඟටම ඇවිත් බත් හොයන්න. මම
ඉක්මනට බත් දැම්මා මෙන්න
එතකොට සද්ද නැතුව ලෑල්ලට
ඇවිල්ලා බත් කනවා ......





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්